# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர்  ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : PE/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.03.25

TR-02 (12)

**සභාපති,**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

මහත්මයාණෙනි,

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08.</u>**

**<u>දිස්ත්‍රික් අවශ්‍යතා සඳහා ඛනිජ තෙල් ගබඩා කර තබා ගැනීම.</u>**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම තේරීම් භාර නිලධාරීන්ට ඡන්ද විමසීමට පෙර දින ඡන්දපොල කාර්ය මණ්ඩලය ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය දිවයින පුරා පිහිටි ඡන්ද මධ්‍යස්ථාන වෙත යැවීමට හා ඡන්ද විමසීමේ දින එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලද නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහාද වාහන විශාල සංඛ්‍යාවක් ධාවනය කරවීමට සිදුවනු ඇත. මෙයට අමතරව ආරක්ෂක සේවා සැපයීම සඳහා පොලීසියටද වාහන විශාල සංඛ්‍යාවක් ධාවනයෙහි යෙදවීමට සිදුවනු ඇත. මේ තත්වය මත මෙම වාහන සඳහා විශාල ඉන්ධන ප්‍රමාණයක් එම කාලසීමාව තුළදී අවශ්‍ය වනු ඇත.

03. එහෙයින් හිඟයකින් තොරව ඉන්ධන ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම පිණිස ඡන්ද විමසීම දිනයට සතියක පමණ කාලයක සිට හා ඡන්ද විමසීම නිමවී සතියක පමණ කාලසීමාවක් ගතවන තෙක් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම් හල්හි ප්‍රමාණවත් ඉන්ධන තොග පවත්වාගෙන යන බවට සහතික වීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් යෙදීමට කටයුතු කරන මෙන් ඔබ කාරුණිකව දන්වමි.

04. පසුගිය ඡන්ද විමසීම් වලදී දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල්හි ප්‍රමාණවත් පරිදි ඉන්ධන ගබඩා කර තබා ගැනීමට කටයුතු යෙදීම පිළිබඳව ඔබට බෙහෙවින් කෘතඥ වෙමි.

05. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.

මෙයට - විශ්වාසී,

**දයානන්ද දිශානායක,**

මැතිවරණ කොමසාරිස්.

**පිටපත** : සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා නියෝජ්‍ය/
ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත - දැනගැනීම සඳහා.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණමහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: පීර්/10/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2010.03.25

TR- 02 (12) A

**සභාපති,**

සී/ස කළුතර විවිධ සේවා සමුපකාර සමිතිය,

කළුතර.

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08.</u>**

2010.04.08 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී කළුතර දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීට මැතිවරණ කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍යයන් ඡන්ද පොළ වෙත ප්‍රවාහනය කිරීම ඇතුළු ප්‍රවාහන අවශ්‍යතා සඳහා වාහන විශාල ප්‍රමාණයක් ධාවනය කරවීමට සිදුවේ. මීට අමතරව ආරක්ෂක සේවා සැපයීම පිණිස පොලිසියටද වාහන විශාල ප්‍රමාණයක් ධාවනය කරවීමට සිදුවනු ඇත. එබැවින් ඡන්ද විමසීම දිනයට සතියකට පමණ පෙර සිට හා ඡන්ද විමසීම නිම වී දින කිහිපයක් ගතවන තෙක් හිඟයකින් තොරව ඉන්ධන ලබාගැනීම පිණිස කළුතර විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ඉන්ධන පිරවුම් හලට අවශ්‍ය ඉන්ධන සැපයුම් කරන ලංකා ඉන්දියන් ඔයිල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ් පිරවුම් හලින් අවශ්‍ය තොග ඇණවුම් කර රැස්කර තබා ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

02. මීට පෙර පැවති ඡන්ද විමසීම් වලදීද කළුතර දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවනු ලැබූ වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම ඔබ ඉන්ධන හලෙන්ද සිදුකර ඇති බවත්, එහි වඩා ඉඩ පහසුකම් ඇති හෙයින් වාහන වලට ඉන්ධන ලබා ගැනීම පහසු බවත් කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් මා වෙත වාර්තා කර ඇත.

03. මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිසානායක,**

මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 01. දිස්ත්‍රික් ලේකම් හා තේරීම් භාර නිලධාරී , කළුතර - දැනගැනීම සඳහා.
02. ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් , කළුතර - දැනගැනීම සඳහා.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர்          ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : P.E/24/2010
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය : 2010.03.25
திகதி :

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / තේරීම් භාර නිලධාරීන්**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර**

**මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>2010.04.08 දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් ඉන්ධන සැපයීම.</u>**

2010.04.08 දින පැවැත්වෙන උක්ත මැතිවරණයේදී දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට සිය ප්‍රවාහන කටයුතු සිදු කරලීමේදී අවශ්‍ය ඉන්ධන තොග ගබඩා කර තැබීමේ වැඩපිළිවෙල පිළිබඳව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිය ප්‍රාදේශිය බෙදා හරින්නන් දැනුවත් කර ඇති බවට මා වෙත දැනුම් දී ඇති 2010.03.15 දිනැති ලිපියෙහි ජායා පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

**වජිර ගුණවර්ධන,**
සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන).

**අත්. කළේ : දයානන්ද දිශානායක**
මැතිවරණ කොමසාරිස්.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) - 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : P.E/10/24
எனது இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය : 2010.03.05
திகதி :

<u>TR - 02 (13)</u>

**<u>ඉතා වැදගත්</u>**

ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී

ශ්‍රී ලංකා දුම්රිය සේවය

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08</u>**

**<u>රාජකාරී දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම සහ බිල්පත් නිරවුල් කිරීම</u>**

ඉහත සඳහන් ඡන්ද විමසීමේදී මැතිවරණ රාජකාරීන් සඳහා කොළඹින් පිටත්ව යන නිලධාරීන්ට, දුම්රිය පහසුකම් සලසා දීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා විශේෂ දුම්රිය ධාවනයක් අවශ්‍ය නොවනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ. එහෙත් දුම්රිය මැදිරි වෙන් කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ බව ඔබ වෙත නොපමාව දැනුම් දීමට කටයුතු කරනු ඇත.

02. ඡන්ද විමසීම් රාජකාරී සඳහා පිටත්ව යන නිලධාරීන්ට අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තුවලින් නිකුත් කිරීමට සිදුවන රාජකාරී දුම්රිය බලපත්‍ර ඔබ විසින් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත වෙන් කර දී ඇති සංකේත අංක 5422/1 යටතේ නිකුත් කිරීමට එම අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලය පැවරීමටත්, එම සංකේත අංකය රබර් මුද්‍රාවක් මගින් සටහන් කිරීම වෙනුවට අතින් ලිවීමටත් බලපත්‍රයේ රාජකාරී ස්වභාවය යනුවෙන් දක්වා ඇති ස්ථානයේ "2010- පාර්ලිමේන්තු මැතිවරණය" යනුවෙන් සටහන් කිරීමට හා නිකුත් කරන නිලධාරියාගේ තනතුරට යටින් "මැතිවරණ කොමසාරිස් වෙනුවට" යනුවෙන් සඳහන් කිරීමටත් උපදෙස් දීමට ඔබගේ අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

03. මෙසේ නිකුත් කරනු ලබන දුම්රිය බලපත්‍ර පිළිබඳ වාර්තා මැතිවරණ දෙපාර්තමේන්තුවට එවන ලෙස අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට උපදෙස් දෙනු ලබන අතර, ඡන්ද විමසීමේ රාජකාරී සඳහා ලබාගත් එම දුම්රිය බලපත්‍ර පිළිබඳ බිල්පත් මා වෙත ලැබුණු පසු ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

04. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක විය යුත්තේ පාර්ලිමේන්තු මැතිවරණය -2010 සඳහා පමණක් බව විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. මේ සඳහා ඔබගේ අනුමැතිය කඩිනමින් මා වෙත ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

05. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිසානායක,**

මැතිවරණ කොමසාරිස්.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : PE/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය : 2010.03.22
திகதி :

TR/11/16

**සියළුම අමාත්‍යංශ ලේකම්වරුන් සහ**

**දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08</u>**

**<u>රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීම</u>**

2010.04.08 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරී සඳහා පත් කර ඇති නිළධාරීන් රාජකාරී දුම්රිය බලපත් ඉල්ලා සිටින්නේ නම් එම ඉල්ලීම් පරිදි බලපත් නිකුත් කිරීමට කරුණාකර පියවර ගන්න.බලපත් නිකුත් කිරීම්, ආයතන සංග්‍රහයේ සඳහන් දුම්රිය බලපත් නිකුත් කිරීම හා සම්බන්ධ විධිවිධාන පරිදි සිදුකළ යුතුවේ.

02. බලපත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ විශේෂ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02.1 දෙපාර්තමේන්තු සංකේත අංකය ලෙස 5422/1 පැහැදිලි ලෙස ද, රබර් මුද්‍රාවකින් සටහන් කිරීම වෙනුවට අතින් ලියන්න.

02.2 රාජකාරියේ ස්වභාවය " පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරී " යනුවෙන්ද සටහන් කරන්න.

02.3 වැය ශීර්ෂය : 17:1:1-1405-5 A

03. බලපත් නිකුත් කරන ලද නිළධාරියාගේ තනතුර සටහන් කිරීමට ඇති ස්ථානයේ බලපත්‍රය අත්සන් කරන ලද නිළධාරියාගේ නිල මුද්‍රාව තබා ඊට යටින් " මැතිවරණ කොමසාරිස් වෙනුවට " යනුවෙන් අකුරින් ලියන්න.

04. මේ යටතේ නිකුත් කරන සියලුම බලපත්‍ර බේරුම් කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ඇත. එහෙයින් මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන දුම්රිය බලපත් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන දෙපාර්තමේන්තු විසින් මුදල් ගෙවීමක් සිදු කළ යුතු නොවේ.

05. මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන සියලුම දුම්රිය බලපත් පිළිබඳ විස්තරයක් මේ සමඟ අමුණා ඇති ආදර්ශ ලිපිය පරිදි සකස් කර මැතිවරණය නිම වී සති දෙකක් තුළදී මා වෙත ලැබෙන සේ එවිය යුතු බවද කරුණාවෙන් සලකන්න.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්

**පිටපත්** - 01. අතිරේක මැතිවරණ කොමසාරිස් (1)
02. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා.
03. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත - දැනගැනීම සඳහා
04. දුම්රිය ගණකාධිකාරී (ආදායම් II) - දැන ගැනීම සඳහා
05. ගණකාධිකාරී (මුදල්) - දැනගැනීම සඳහා
06. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා.

මගේ අංකය :

දිනය : 2010.03.22

**මැතිවරණ කොමසාරිස්,**

මැතිවරණ මහලේකම් කාර්යාලය,

සරණ මාවත,

රාජගිරිය,

ශ්‍රී ජයවර්ධනපුර.

**පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08**

**මැතිවරණ රාජකාරි සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලයට නිකුත් කළ දුම්රිය බලපත්**

2010.04.08 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරි සඳහා යොදවනු ලැබූ නිළධාරීන්ට මෙම අමාත්‍යංශය / දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජකාරි දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

02. මෙම බලපත්‍ර සඳහා බිල්පත ඔබගේ වැය ශීර්ෂයන්ගෙන් නිරවුල් කිරීම සඳහා මෙම විස්තර ඔබ වෙත ඉදිරිපත් කරමි.

…………………………………

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා

……………………………… අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව

| (1) බලපත්‍රය නිකුත් කළ දිනය | (2) නිළධාරියාගේ නම | (3) බලපත්‍ර අංකය | (4) දුම්රිය ස්ථාන | |
|---|---|---|---|---|
| | | | ගමන ආරම්භ කළ දුම්රිය ස්ථානය | ගමන අවසන් කළ දුම්රිය ස්ථානය |
| | | | | |

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණමහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය: PE/10/24
எனது இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය : 2010.03.05

TR-02(14)

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා**
**නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර**
**මැතිවරණ කොමසාරිස්වරුන් වෙත.**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010</u>**
**<u>මැතිවරණ රාජකාරී අතරතුරදී කාර්මික දෝෂවලට ලක්වන</u>**
**<u>රජයේ වාහන අළුත්වැඩියා කිරීම.</u>**

2010.04.08 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ මූලික කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම පිණිස ඔබ විසින් යොදා ගනු ලබන රජයේ වාහනයක් හෝ මැතිවරණ කටයුතු සඳහා කැඳවන ලද රජයේ වාහනයක් හෝ නිලධාරීන් විසින් රැගෙන එන ලද රජයේ වාහනයක් හෝ කාර්මික දෝෂයකට ලක් වුවහොත් එම වාහනය අළුත්වැඩියා කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

02.

(I) සිදුවී ඇති කාර්මික දෝෂය පිළිබඳව හා සිදුකළ යුතු අළුත්වැඩියාව පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂක ලවා වාර්තාවක් ලබා ගැනීම.

(II) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත ගරාජ තුනකින් මිල ගණන් ලබා ගැනීම.

(III) එම මිල ගණන් පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ නිර්දේශය හා ඔබගේ නිර්දේශය ද සමඟ නොපමාව 2868450 ෆැක්ස් අංකය මඟින් සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවා මාගේ අනුමැතිය ලබා ගැනීම

03. මාගේ අනුමැතිය ලද පසු වාහනයේ අළුත්වැඩියාව සිදුකර එම අළුත්වැඩියාව හොඳින් ඉටු කර ඇති බවට මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂක ලවා සහතික කරවා ගත යුතු අතර, වාහනයට අළුතින් අමතර කොටස් යොදා ඇත්තේ නම් ඒවා නියම (ජෙනුයින්) අමතර කොටස් බවට සැහීමකට පත්විය යුතුය.

අළුත්වැඩියා කරන ලද වාහනයට අදාල ලොග් පොතෙහි කරන ලද අළුත්වැඩියාවට අදාල තොරතුරු ඇතුලත් කිරීම පිණිස සම්පූර්ණ විස්තරයක් හා වැය වූ මුදල ද සඳහන් කර අදාල වාහනය අයත් ආයතනයේ ප්‍රධානියා වෙත දැනුම් දිය යුතුය. එම ලොග් සටහන් තැබූ බවට ලිපියක් ලබාගත යුතු අතර එහි පිටපතක්ද , අළුත්වැඩියාව පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ වාර්තාවද, අවසන් බිල්පතේ පිටපතක්ද ගොනු කිරීම සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත නොපමාව එවිය යුතුවේ.

04. ඉහත සියළු කටයුතු නිමකිරීමෙන් පසු අවසන් බිල්පත සඳහා ගෙවීම් කිරීමට ,මාගෙන් ලද අනුමැතිය අනුව ගණකාධිකාරී (මුදල්) වෙතින් අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතුවේ. කෙසේ වෙතත් මැතිවරණ කටයුතු සඳහා යොදා ගනු ලබන රජයේ වාහන හැර වෙනත් කිසිඳු වාහනයක අළුත්වැඩියාවක් සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව මැදිහත් නොවිය යුතුය.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 01. සභාපති, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය - මාගේ අනුමත සීමාවෙන් ඔබ්බට වූ හදිසි අළුත්වැඩියාවකදී අවශ්‍ය කටයුතු කිරීමට.

02. ගණකාධිකාරී (මුදල්)
03. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) } - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා